# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2024 දෙසැම්බර්/ 2025 ජනවාරි
### සමාජීය විද්‍යා පීඨය
### සංවර්ධන අධ්‍යයන
### සංවර්ධන න්‍යාය හා භාවිතය - DVST 28214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. 'සංවර්ධන න්‍යායක්' යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 05)

    ii. 'සෑම දෙනාටම වඩා යහපත් ජීවිතයක්' ලබා දීමේදී සංවර්ධන න්‍යායන් අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න. (ලකුණු 15)

02. "සංවර්ධන ක්‍රියාවලිය සෑම විටම යහපත් ප්‍රතිඵල පමණක් බිහි නොකරයි." මෙම ප්‍රකාශය උදාහරණ හතරක් (04) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. i. 'පශ්චාද් සංවර්ධන න්‍යාය' (Post-development theory) යනු කුමක්ද? (ලකුණු 05)

    ii. පශ්චාද් සංවර්ධන න්‍යාය මගින් සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශය විවේචනය කරන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 15)

04. පහත දැක්වෙන සංවර්ධන ප්‍රවේශයන්හි ප්‍රායෝගික භාවිතා පැහැදිලි කරන්න.

    i. යටි-උඩු සංවර්ධන ප්‍රවේශය (bottom-up development approach) (ලකුණු 10)

    ii. උඩු-යටි සංවර්ධන ප්‍රවේශය (Top-down development approach) (ලකුණු 10)

05. රටක ආර්ථික සංවර්ධනයේ පදනම ශක්තිමත් කිරීමට හැරඩ්-ඩොමර් ආදර්ශකය (The Harrod-Domar model) යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

06. ජාත්‍යන්තර ආර්ථික සංවර්ධන කොරිඩෝ (International Development Corridos) මගින් ආර්ථිකමය වශයෙන් දියුණු සහ නොදියුණු රටවල් අතර සංවර්ධන අසමානතා අවම කිරීමට භාවිතා කළහැකි ආකාරය උදාහරණ හතරක් (04) ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

07. සංවර්ධනයේදී ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව (Gender equality) පිළිබඳ විශේෂ අවධානයක් යොමුවිය යුත්තේ මන්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 20)

08. තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ දී නව තාක්ෂණය යොදාගැනීමේ වාසි සහ අවාසි තර්කානුකූලව ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

******************************